01
පාඩම
प्रथमः पाठः

# හෝඩි පොතේ පාඩම්

සංස්කෘත භාෂාවට අයත් වචන ලියන සංකේත දේවනාගරී අක්ෂර මාලාව යැයි අපි දනිමු. අක්ෂර 49කින් සමන්විත එම දේවනාගරී හෝඩිය මෙසේ ය.

## ස්වර 14

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| अ | आ | इ | ई | उ | ऊ | ऋ |
| ॠ | ऌ | ॡ | ए | ऐ | ओ | औ |

## ව්‍යඤ්ජන 35

| | | | | |
|---|---|---|---|---|
| क | ख | ग | घ | ङ |
| च | छ | ज | झ | ञ |
| ट | ठ | ड | ढ | ण |
| त | थ | द | ध | न |
| प | फ | ब | भ | म |
| य | र | ल | व | |
| श | ष | स | ह | |
| अं | अः | | | |

## ස්වර මාලාවේ ප්‍රභේද

### 01. හ්‍රස්ව

එක් මාත්‍රාවක් තුළ උච්චාරණය වන්නේ හ්‍රස්ව නමි. ඒවා පහකි.

अ इ उ ऋ ऌ

### 02. දීර්ඝ

මාත්‍රා දෙකක් තුළ උච්චාරණය වීම මෙහි ලක්‍ෂණයයි. ඒවා 09කි.

आ ई ऊ ॠ ॡ ए ऐ ओ औ

### 03. ප්ලුත

ලියා පෙන්විය නො හැකි ය. එහෙත් දුර සිටින කෙනෙකුට අඬ ගැසීමේදී, ගායනයේදී, ඇඬීමේදී, විචාරයේදී අකුරු ප්ලුත ව කියවේ. ප්ලුතයක මාත්‍රා 02ට වැඩි ය. වචන අවසානයේ ඇදී කියවීම ප්ලුත ස්වභාවයයි.

### 04. සන්ධ්‍යක්‍ෂර

අකුරු දෙකක් එකට එකතු වී සෑදෙන අකුරු සන්ධ්‍යක්‍ෂර නම් වේ. ඒවා 04කි.

ए ऐ ओ औ

### 05. නාමින්


ස්වර මාලාවේ अ आ දෙක හැර ඉතිරි අකුරු 12 නාමින් වේ.

इ ई उ ऊ ऋ ॠ
ऌ ॡ ए ऐ ओ औ

## 06. අනාමින්

ස්වර මාලාවේ **अ आ** දෙක අනාමින් වේ.

**මතකයට**




## ව්‍යඤ්ජන ප්‍රභේද

### 01. වර්ගාක්ෂර

ව්‍යඤ්ජනවල **क** සිට **म** දක්වා අකුරු 25 වර්ගාක්ෂර නම් වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| क | ख | ग | घ | ङ | - ක වර්ගය |
| च | छ | ज | झ | ञ | - ච වර්ගය |
| ट | ठ | ड | ढ | ण | - ට වර්ගය |
| त | थ | द | ध | न | - ත වර්ගය |
| प | फ | ब | भ | म | - ප වර්ගය |

02. අන්තඃස්ථ

අන්තඃස්ථ 04 කි. ස්වර ව්‍යඤ්ජන ස්වභාවයන් දෙක ම දරන බැවින් ද, වර්ගාක්‍ෂර හා ඌෂ්මන් අක්‍ෂර අතර පිහිටන බැවින් ද මෙ නමින් හැඳින්වේ. ඒවා නම්,

य व र ल

03. ඌෂ්මන්

උච්චාරණයේදී සෙසු අකුරුවලට වඩා උණුසුම් වායුවක් පිටවන බැවින් මෙ නමින් හැඳින්වේ. ඒවා 04 කි.

श ष स ह

04. අනුස්වාර

බින්දුව අනුස්වාරය යි.

अं

05. විසර්ග

උඩ යට පිහිටන බින්දු දෙක විසර්ග නම්.

अः

06. වර්ගමූල

වර්ගයන්ගේ මුල පිහිටන අකුරු 05 වර්ගමූල වේ.

क च ट त प

07. වර්ගාන්ත / අනුනාසික

වර්ගයන්හි අන්තයේ හෙවත් කෙළවර පිහිටන අකුරු 05 වර්ගාන්ත වේ. ඒවා ම අනුනාසිකාක්‍ෂර නමින් ද හැඳින්වේ.

ङ ञ ण न म

## 08. අල්පප්‍රාණ

වර්ගයන්හි පළමු හා තෙවැනි අකුරු 10 අල්පප්‍රාණ වේ.

क च ट त प

ज ड द ग ब

## 09. මහාප්‍රාණ

වර්ගයන්හි දෙවැනි, සිවුවැනි අකුරු 10 මහාප්‍රාණ වේ.

ख छ ठ थ फ

घ झ ढ ध भ

## 10. අඝෝෂ

වර්ගයන්හි පළමු, දෙවැනි අකුරු හා श ष स යන අකුරු 13 අඝෝෂ වේ.

क ख च छ ट ठ

त थ प फ श ष स

## 11. ඝෝෂ

වර්ගයන්හි තෙවැනි, සිවුවැනි, පස්වැනි අකුරු හා य र ल व ह යන අකුරු 20 ඝෝෂ වේ.

ग घ ङ ज झ ञ

ड ढ ण द ध न

ब भ म य र ल व ह

මීට අමතරව සියලු ම ස්වර ඝෝෂ නම් වේ. එවිට ඝෝෂ සියල්ල 34 කි.

**ස්වර ඝෝෂ 14+ ව්‍යඤ්ජන ඝෝෂ 20 = 34**

## 1.1 අභ්‍යාසය


01. පහත පඩිපෙළේ පඩි, එක් එක් වචනවලින් නම් කර ඇත. එම පඩිවලට අදාළ අකුරු ඒ ඒ පඩිවල නිවැරදිව සටහන් කරන්න.




02. පහත සඳහන් අවස්ථා වටහා ගන්න. ඒ අතරින් ''ප්ලුත'' ය යෙදී ඇති තැන් වෙන් කර හඳුනාගෙන ලියා දක්වන්න.

1. බඩගිනි වූ දරුවෙක් කිරි ඉල්ලා අඬයි
2. බල්ලෙක් හඬට බුරයි.
3. ගස්මුදුනක සිටින මොනරෙක් නාද කරයි.
4. ධර්ම ශාලාවේ සිටින පොඩි හාමුදුරුවන්ට ලොකු හාමුදුරුවෝ ආවාසයේ සිට ''උන්නාන්සේ'' යැයි අඬ ගසයි.
5. දන්නෝ බුදුන්ගේ........ ශ්‍රී ධර්මස්කන්ධා....... යන ගීතයේ තනුව ඇසේ.
6. අත්තක හිඳින කපුටෙක් කෑ ගසයි.
7. කුකුළෙක් තටු සලා හඬයි.
8. පිරිවෙන් නො පැමිණි ශිෂ්‍ය හිමිනමකගෙන් ඒ පිළිබඳ ව ගුරු හිමි ප්‍රශ්න කරයි.

03. පහත විශාල මල්ලේ ඇති අකුරු අතරින් කුඩා මලුවලට අයත් අකුරු තෝරා එම මලුවලට දමන්න.



04. පහත වචන කියවා එහි ඇති අකුරු නිර්දේශ කර ඇති පරිදි වගුවේ යොදන්න.

| | | | |
|---|---|---|---|
| १. | नर | २. | जनक |
| ३. | चषक | ४. | फल |
| ५. | अलस | ६. | भषण |
| ७. | शलभ | ८. | धवल |
| ९. | चटक | १०. | गमन |
| ११. | पठन | १२. | आपतन |
| १३. | आकर | १४. | घटन |
| १५. | छगलक | १६. | झञझन |
| १७. | अथ | १८. | दमरा |
| १९. | उपयम | २०. | उभयचर |

| වර්ග මූල | වර්ගාන්ත/ අනුනාසික | මහාප්‍රාණ | අන්තඃස්ථ | ඌෂ්මන් |
|---|---|---|---|---|
| | | | | |

05. ව්‍යඤ්ජන අක්ෂර සියල්ල ම ඔබේ අභ්‍යාස පොතේ පිළිවෙළින් ලියන්න. ඉන්පසු ඝෝෂ අකුරු එක පාටකින් ද අඝෝෂ අකුරු තව පාටකින් ද පාට කරන්න.

06. අල්පප්‍රාණ ඇතුළත් වන සේ වචන දහයක් පෙළ පොතෙන් උපුටා ලියන්න.

**භාවිතයට**

निरुत्साहं निरानन्दं निर्वीर्यमरिनन्दनं ।
स कर्मकारभस्त्रेव श्वसन्नपि न जीवति ॥

උත්සාහයක් නැති, කිසි ම දෙයකින් සෑහීමක් නැති, වීර්යයක් නැති, විරුද්ධවාදීන් සතුටු කරන්නා වූ පුද්ගලයා මයිනහමක් (කම්මල් කර්මාන්තයෙහි භාවිත කරන) මෙන් හුස්ම ගත්තත් ජීවත් වන්නෙක් නො වේ.